# සිංහල සමාජ චාරිත්‍ර වාරිත්‍ර

# හා

# රජක කුලයේ කාර්ය භාරය

Main_Library_UVPA
057930

057930

0144
057930
2020/02/18
ML/PR

# සිංහල සමාජ චාරිත්‍ර වාරිත්‍ර

# හා

# රජක කුලයේ කාර්ය භාරය

අනෝමා එම්. යකුපිටිය
DD/MP/DA/08/13
පශ්වාද් උපාධි අධ්‍යයන පීඨය
සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය
ප්‍රාසංගික කලාපති උපාධි පාඨමාලාව
2019 වර්ෂය

# අන්තර්ගතය

මෙම නිබන්ධය ආරම්භයේ ඇතුළත් කර ඇති හැඳින්වීම මඟින් සිදු කෙරෙන අධ්‍යයන කාර්ය විස්තර කෙරිණ. අනතුරුව ප්‍රවේශයෙන් එහි අරමුණු විෂය ක්ෂේත්‍රය, විෂය කාල පරිමාණය හා ක්‍රමවේදය යන කරුණු සාකච්ඡා කරන්නට විය. මෙම නිබන්ධය සම්පාදනය කිරීමේදී පළමුවැනි පරිච්ඡේදය වෙන් කළේ මූලාශ්‍ර හැඳින්වීම හා සාහිත්‍යයික ඇගයීම සඳහා ය. එහිදී විෂයානුබද්ධ පසුබිම සහ ඓතිහාසික සාහිත්‍යමය මූලාශ්‍රය කෘතීන් අතරින් කිහිපයක විස්තර සැකෙවින් ඉදිරිපත් කර ඇත. ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය වශයෙන් යොදාගත් එකී ලිඛිත මූලාශ්‍රයට අමතරව අලිඛිත මූලාශ්‍රය යටතේ ගැනෙන ක්ෂේත්‍ර අධ්‍යයනයට අයත් තොරතුරු ද ඊට අන්තර්ගත කෙරිණි. එහිදී අප විසින් නරඹන ලද ශාන්තිකර්ම හා පවත්වන ලද සම්මුඛ සාකච්ඡා පිළිබඳ තොරතුරු ද ඇතුළත් වේ.

දෙවැනි පරිච්ඡේදය සිංහල සමාජයේ ආරම්භය හා ව්‍යාප්තිය යනුවෙන් හැඳින්විය. එහිලා සිංහල සමාජයේ ආරම්භය සිංහල සමාජ සංස්කෘතියේ පදනම හා සිංහල සමාජයේ ව්‍යාප්තිය සහ කුල ස්ථරයන් පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කෙරේ. තෙවැනි පරිච්ඡේදය වෙන්කොට ඇත්තේ ශ්‍රී ලාංකේය සමාජ චාරිත්‍ර වාරිත්‍ර හා ජනශ්‍රැතිය උදෙසා ය. එහිදී ආගමික චාරිත්‍ර වාරිත්‍ර හා සමාජීය චාරිත්‍ර වාරිත්‍ර යටතේ ශ්‍රී ලාංකේය චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව සිදු කෙරුනු අධ්‍යයනයක් ද අන්තර්ගත වේ. හතරවැනි පරිච්ඡේදයෙන් රජක කුලයේ සම්භවය සහ ව්‍යාප්තිය යන මාතෘකාව යටතේ රජක කුලය අර්ථකතනය, රජක කුලයේ ව්‍යාප්තිය සහ රජක කුලය සම්බන්ධ ජනශ්‍රැති පිළිබඳව විග්‍රහයන් ඊට එක් කර ඇත.

පස්වැනි පරිච්ඡේදයෙන් ගැමි වත්පිළිවෙත් සඳහා රජක කුලයේ දායකත්වය යන මාතෘකාව යටතේ ආගමික වත්පිළිවෙත් හා රජක කුලයේ දායකත්වය, ශාන්තිකර්ම හා රජක කුල දායකත්වය සමාජීය වත්පිළිවෙත් සඳහා රජක කුල දායකත්වය පිළිබඳව තොරතුරු අන්තර්ගත වේ. එහිදී සමාජීය වත්පිළිවෙත් සඳහා රජක කුල දායකත්වය විග්‍රහ කිරීමේදී ද්වාරකර්ම පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. තාක්ෂණික

උපකරණ භාවිතය යන කරුණු සම්බන්ධයෙන් දෘෂ්ටිවාදාත්මක විග්‍රහයක් ද එම පරිච්ඡේදයෙහිලා අන්තර්ගත කෙරිණි. ඒ හැරුණු කොට මෙම නිබන්ධනෙහිලා ඇතුළත් කරුණු විශ්ලේෂණය කිරිමේදී අප විසින් එක්රැස් කරන ලද ඡායාරූප ඇතුළත් කොට උපග්‍රන්ථයක් ද මෙම නිබන්ධය සඳහා පරිශීලනය කරන ලද පොත්පත් හා ලිපි ඇතුළත් සඟරා පිළිබඳ තොරතුරු ඇතුළත් ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියක් ද ඇතුළත් කිරිමට උත්සුක වුනෙමු. ඒ අතර පර්යේෂණ ග්‍රන්ථයක ඇතුළත් කළයුතු යැයි සැලකෙන වචන අනුක්‍රමණිකාවක්/සුචියක් මෙහිලා ඇතුළත් කර දැක්වීමට අප අමතක නොකළෙමු.